# (ඇ) මිල හා වැටුප්

## මිල

ජීවන වියදමෙහි ඇතිවන වෙනස් වීම් මැනීම සඳහා වෙනත් දරශකයක් නොමැති බැවින් කොළඹ කම්කරු පන්තියේ පවුලක අයවැය අනුව සංගණන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් සකසා ඇති පාරිභෝගික මිල දර්ශනය උපයෝගී කොට ගනී. මේ දර්ශකයට ගැනෙන භාණ්ඩ බර තබනු ලබන්නේ 1953 අංක VI දරන සැසි වාර්තාවේ නිර්දේශයන් (පහත සංඛ්‍යා සටහනෙහි වරහන් කොට ඇති සංඛ්‍යා බලන්න) අනුවය.

1955 වර්ෂයේ සිට පාරිභෝගික මිල දර්ශකයේ ඇතිවූ වෙනස්වීම් භාණ්ඩ අනුව සහ ගණ අනුව වර්ග කොට පහත සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II (ඇ) – 1

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය**

**(පාදය 1952 = 100)**

| වර්ෂය | සියලුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | ගණ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර පාන (61·9%) | රෙදිපිළි (9·4%) | ඉන්ධන හා එළිය (4·3%) | ගෙවල් කුලී (5·7%) | විවිධ (18·7%) | දේශීය ගණය (51%) | ආනයන ගණය (44%) | අපනයන ගණය (5%) |
| 1955 .. | 100·5 | 105·1 | 80·5 | 102·3 | 101·5 | 94·6 | 98·4 | 102·8 | 102·2 |
| 1956 .. | 100·2 | 103·3 | 81·8 | 101·3 | 101·5 | 98·6 | 100·0 | 99·0 | 115·1 |
| 1957 .. | 102·8 | 104·9 | 84·4 | 97·3 | 101·5 | 106·9 | 104·9 | 98·1 | 126·8 |
| 1958 .. | 105·0 | 105·8 | 87·5 | 101·0 | 101·5 | 113·1 | 109·2 | 97·0 | 135·0 |
| 1959 .. | 105·2 | 104·7 | 92·1 | 102·4 | 101·5 | 115·3 | 108·0 | 97·1 | 153·1 |
| 1960 .. | 103·5 | 100·8 | 95·1 | 102·7 | 101·5 | 117·5 | 108·9 | 93·7 | 138·4 |
| 1961 .. | 104·8 | 99·8 | 103·9 | 104·4 | 101·5 | 122·8 | 112·3 | 94·6 | 119·1 |
| 1962 .. | 106·3 | 100·9 | 108·2 | 105·6 | 101·5 | 124·9 | 113·9 | 96·7 | 113·8 |
| 1963 .. | 108·8 | 103·0 | 118·2 | 103·0 | 101·5 | 126·6 | 113·4 | 102·5 | 117·7 |
| 1964 .. | 112·2 | 106·4 | 127·2 | 103·2 | 101·5 | 129·3 | 116·7 | 106·6 | 115·3 |

සංඛ්‍යා – සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව –

1964 පාරිභෝගික මිල දර්ශකයෙහි ඇතිවූ මාසික වෙනස්වීම් පහත දැක්වේ.

සංඛ්‍යා සටහන II (ඈ) - 2

**පාරිභෝගික මිල දර්ශකයෙහි ඇති වූ මාසික වෙනස්වීම්**

**(පාදය 1952 = 100)**

| මාසය | සියලුම ශීර්ෂ | | | ආනයන ගණය | | | දේශීය ගණය | | | අපනයන ගණය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1963 | 1964 | වෙනස % | 1963 | 1964 | වෙනස % | 1963 | 1964 | වෙනස % | 1963 | 1964 | වෙනස % |
| ජනවාරි .. | 107·1 | 111·2 | + 3·8 | 98·7 | 103·3 | + 4·7 | 112·4 | 117·5 | + 4·5 | 128·7 | 113·3 | —12·0 |
| පෙබරවාරි .. | 107·8 | 111·5 | + 3·4 | 100·5 | 105·0 | + 4·5 | 112·5 | 116·5 | + 3·6 | 126·2 | 117·4 | — 7·0 |
| මාර්තු .. | 108·0 | 111·4 | + 3·2 | 101·8 | 106·7 | + 4·8 | 112·0 | 115·2 | + 2·9 | 123·9 | 114·7 | — 7·4 |
| අප්‍රේල් .. | 109·1 | 112·1 | + 2·8 | 103·7 | 107·7 | + 3·9 | 112·6 | 115·4 | + 2·5 | 122·6 | 117·6 | — 4·1 |
| මැයි .. | 109·1 | 112·7 | + 3·3 | 103·3 | 107·4 | + 4·0 | 113·3 | 117·1 | + 3·4 | 118·1 | 114·9 | — 2·7 |
| ජූනි .. | 109·2 | 112·8 | + 3·3 | 103·3 | 107·3 | + 3·9 | 113·9 | 117·3 | + 3·0 | 113·9 | 115·2 | + 1·1 |
| ජූලි .. | 109·3 | 112·4 | + 2·8 | 104·8 | 107·3 | + 2·4 | 112·8 | 116·9 | + 3·5 | 113·1 | 111·3 | — 1·6 |
| අගෝස්තු .. | 108·4 | 112·0 | + 3·3 | 104·3 | 106·8 | + 2·4 | 111·8 | 116·4 | + 4·1 | 111·4 | 112·6 | + 1·1 |
| සැප්තැම්බර් | 108·0 | 112·1 | + 3·8 | 103·3 | 106·4 | + 3·0 | 111·6 | 116·9 | + 4·7 | 112·1 | 112·6 | + 0·4 |
| ඔක්තෝබර් . | 109·2 | 112·8 | + 3·3 | 102·2 | 106·9 | + 4·6 | 114·7 | 117·7 | + 2·6 | 114·2 | 114·7 | + 0·4 |
| නොවැම්බර් | 109·8 | 113·2 | + 3·1 | 102·1 | 107·6 | + 5·4 | 116·0 | 117·5 | + 1·3 | 113·4 | 118·3 | + 4·3 |
| දෙසැම්බර් .. | 110·3 | 112·4 | + 1·9 | 101·9 | 107·3 | + 5·3 | 117·1 | 116·1 | — 0·9 | 115·0 | 120·8 | + 5·0 |
| සාමාන්‍ය .. | 108·8 | 112·2 | + 3·1 | 102·5 | 106·6 | + 4·0 | 113·4 | 116·7 | + 2·9 | 117·7 | 115·3 | — 2·0 |

සංඛ්‍යා   සංගනන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව මනින කල, සිල්ලර මිල මට්ටමේ සාමාන්‍යය 1964 දී 1963 මට්ටමට වඩා සියයට 3·1 කින් වැඩිවී ඇත. මෙයින් අපනයන ගණ දර්ශකයෙහි සියයට 2.0 ක පහළ වැටීමෙක් පමණටත් වඩා මකාලමින් ආනයන ගණ දර්ශකය සියයට 4.0 කින්ද, දේශීය ගණ දර්ශකය සියයට 2.9 කින්ද ඉහළ නැගීම පිළිබිඹු විය.

II (ඇ) වැනි සංඛ්‍යා සටහනේ එන ඒකාබද්ධ භාණ්ඩ ගණ දර්ශකය 1963 සංඛ්‍යා හා සසඳන කල 1964 දී ආහාර දර්ශකය සියයට 3.3 කින්ද, රෙදිපිළි දර්ශකය සියයට 7·6 කින්ද, ඉන්ධන හා එළිය දර්ශකය සියයට 0·2 කින්ද, විවිධ ශීර්ෂ දර්ශකයන් සියයට 2·1 කින්ද ඉහළ ගොස් ඇත. ගෙවල්කුලී දර්ශකයෙහි වෙනසක් නොවිණි.

1964 දී ආනයන ගණයේ ආහාර වන උකුකල කිරි, කුළුබඩු, රතුලූනු, රටලූනු, සිල්ලර බඩු, කරවල, බිත්තර සහ අර්තාපල් මිල වැඩිවිය. දේශීය ආහාර ගණයෙහි එළවළු හා පළතුරු, කිරි, තේ, සිසිල් බීම සහ මෙරට බිත්තර යනා මේවායේ මිල වැඩිවිය.

අපනයන ආහාර ගණය සියයට 2.0 කින් පහළ වැටිණ. මෙයට බෙහෙවින්ම හේතු වූයේ පොල් හා ගම්මිරිස් මිල අඩුවීමය. එහෙත් 1964 අපනයන ආහාර ගණයෙහි මේද හා තෙල් මිල වැඩිවිය.

1964 මුලුල්ලේම රෙදිපිළි ගණ දර්ශකය 1963 දීට වඩා ඉහළ මට්ටමක පැවතියේය.

විවිධ ශීර්ෂ ගණ දර්ශකය සියයට 2·1 කින් ඉහළ යාමට ප්‍රධාන හේතුව වූයේ හිසකෝ කැපීමේ සහ රෙදි සේදීමේ සේවාවන් සඳහා අය කැරෙන ගාස්තු වැඩිවීමය. ඖෂධ වර්ගවල මිලද වැඩිවිය. 1963 අගෝස්තු මාසයේදී දුම්කොළ සඳහා වැඩිකල තීරු ගාස්තු 1964 වර්ෂය මුළුල්ලේද නොකඩවා බලපැවැත්විනි.

ඉන්ධන හා විදුලි ගණ දර්ශකය සියයට 0.2 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. 1963 අගෝස්තු මාසයේදී බූමිතෙල් සඳහා තීරු ගාස්තු අඩු කළ බැවින් භූමිතෙල් මිල අඩු වුවද, ගිනිපෙට්ටි හා දර මිල වැඩිවීමෙන් එය පමණටත් වඩා මැකී ගියේය.

1964 වර්ෂය තුළදී අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල පාලනය කිරීමට හා වෙළෙඳුන් කෙරෙහි දැඩි පාලනයක් පවත්වාගෙන යාමට ගන්නා ලද පියවරවල් මෙසේය. බඩු අඩුවීම නිසා මිල ඉහළ යාම වලක්වාලීම සඳහා ආනයන කරුවන්ට දී ඇති සම්පූර්ණ භාණ්ඩ සලාකය ගෙන්වීමට ඔවුන්ගෙන් ඉල්ලා සිටීමෙන් කෘත්‍රිම හිඟයක් ඇතිවීම වලක්වා ලීමට උත්සාහ දරන ලදී. අලෙවි කරන එළවළු ප්‍රමාණය වැඩි කිරීමෙන් එළවලු මිල අඩු කිරීම සඳහා අලෙවි දෙපාර්තමේන්තුව මගින් පියවර ගන්නා ලදී. ගම්බද හා නාගරික පෙදෙස්වල තිබෙන අලෙවි මධ්‍යස්ථාන වැඩි කිරීමට සමුපකාර සමිති උනන්දු කරන ලදී.

අනෙකුත් හරක් මස් වෙළෙන්දන් සමග තරගකාරීව හරක් මස් විකිණීම සඳහා සාධාරණ මිලට මස් විකුණන ස්ථාන දෙපාර්තමේන්තුව විසින් විවෘත කරන ලදී.

මාලු අලෙවි කිරීමේ ලංකා සමුපකාර සංගමය මගින් නාගරික පෙදෙස්වල අලෙවි මධ්‍යස්ථාන ගණන වැඩි කිරීමට ප්‍රයත්න දරන ලදී. තවද, මාලු නිෂ්පාදනය වැඩි කිරීම පමණක් නොව පාරිභෝගිකයාට සාධාරණ මිලට හා ක්‍රමවත්ව මාලු බෙදා හැරීම සඳහා රජය විසින් ධීවර සංස්ථාවක් පිහිටුවනු ලැබීය.

සමුපකාර සමිතිවල සලාක ක්‍රමයට රෙදිපිළි නිකුත් කිරීමෙන් රෙදිපිළි මිල පහත හෙළීමට 1963 අවසානයේදී ගත් පියවරවල් 1964 වර්ෂයේදීද නොකඩවා ක්‍රියාත්මක කැරිණි. 1964 මුල් භාගයේදී සලාක පොත් හිමියකුට රෙදි යාර හතර බැගින් නිකුත් කරන ලදී. එහෙත් අවුරුද්දේ දෙවැනි භාගයේදී මෙම සලාකය යාර තුන දක්වා අඩු කැරිණි. කෙසේ වුවද සුදුරෙදි, පොප්ලින් හා අමුරෙදි සලාකය යාර 4 ම විය. 1964 මුල් මාස 5 තුළදී, රෙදිපිළි මිල ඉතා වේගයෙන් ඉහළ ගියේය. 1964 මුල් භාගයේදී රෙදිපිළි ආනයන පරිමාව වැඩිවීමත්, ආනයන තොග අත්පත් කර ගැනීම සඳහා විධිවිධාන පනවන බැව් ජූලි අවසානයේදී ප්‍රකාශයට පත් කිරීමත් හේතුකොටගෙන 1964 ජූලි මාසයෙන් පසුව සැපයුමෙහි වැඩිවීමක් දක්නට ලැබිනි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය මුළු අර්ථ ක්‍රමයෙහි මිල වෙනස්වීම මැනී-මෙහිලා ප්‍රමාණවත් දර්ශකයක් නොවන බව සැලකිය යුතුය. මෙය කොළඹ කම්කරු පංතියේ පවුලක ප්‍රයෝජනයට ගනු ලබන සාමාන්‍ය පාරිභෝගික භාණ්ඩ-වලට පමණක් සීමාවී ඇත. මෙම දර්ශකයෙහි වැඩියෙන් බර තැබෙන භාණ්ඩ ආනයන සීමා කිරීම්වල බලපෑමක් ඇති නොවන, මිල ආධාර ලැබෙන හෝ මිල පාලනය කොට ඇති හෝ භාණ්ඩ වෙයි.

## ජීවන වියදම් දර්ශකයට නොගැනෙන මිල

ජීවන වියදම් දර්ශකයට නොගැණෙන ප්‍රධාන භාණ්ඩවල සිල්ලර මිල පිළිබඳ සමීක්ෂණයක් 1964 දී පවත්වන ලදී. මේ සමීක්ෂණයට ඇතුළත් භාණ්ඩවලට ගොඩනැගිලි උපකරණ, තෙල් හා සායම් වර්ග, ගෘහ භාණ්ඩ (කෙටි හෝ දිගු කාලයක් පාවිච්චි කළහැකි කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ,) මෝටර් රථ උපකරණ හා පොහොර වර්ග ඇතුළත් විය.

1963 මිල හා සසඳන විට 1964 දී භාණ්ඩ ගණ බොහොමයකම මිල වැඩිවී තිබිණ. බොහෝ සෙයින් මිල වැඩිවූයේ මෝටර් රථවල අමතර කොටස් හා උපකරණවල සහ වැඩිකල් නොපවත්නා පාරිභෝගික භාණ්ඩ ගණවලය. ගොඩනැගිලි භාණ්ඩ, තෙල් හා සායම්, දිගුකල් පවත්නා ගෘහ භාණ්ඩ හා පොහොර ගණයන්හි මිල වැඩිවූයේ සුළු වශයෙනි.

වැටුප්

1964 සේවකයන් බොහෝ දෙනෙකුගේ මූලික වැටුප් අනුපාතිකයන්හි වෙනසෙක් ඇති නොවිණි. වෙනස්කම් සටහන්වී ඇති තන්හි එසේවී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම ජීවන වියදම් දර්ශකය සමග වෙනස්වන දීමනා වැඩිවීම හේතුකොටගෙනය. සේවකයන්ගේ වැටුප් අනුපාතිකයන්හි වසරින් වසර ඇතිවන වෙනස්කම් පිළිබඳ දර්ශකයන් ඇත්තේ රජයේ සේවකයන්, රජයේ පාසල් ගුරුවරුන් හා පඞ් පාලක සහා යටතේ නියුතු සේවකයන් සම්බන්ධයෙන් පමණකි.

1955 සිට රජයේ සේවකයන්ගේ හා රජයේ පාසල් ගුරුවරුන්ගේ වැටුප් අනුපාතිකයන්හි හා මූර්ත වැටුප් අනුපාතිකයන්හි ඇතිවූ වෙනස්වීම් පහත සංඛ්‍යා සටහනින් දක්වේ. 1964 වර්ෂයේ මෙම සේවකයන්ගේ වැටුප් අනුපාතිකයන්හි වෙනසක් නොවිනි.

සංඛ්‍යා සටහන II (ඈ) 3

**රජයේ සේවකයන්ගේ වැටුප් අනුපාතික දර්ශක අංක**

**(1952 = 100)**

| කාලච්ඡේදය | ලිපිකරු හා කාර්මික සේවකයෝ | | සුළු සේවකයෝ | | මහ ආණ්ඩුවේ සේවකයෝ (අ) | | රජයේ පාසල් ගුරුවරු | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතිකයන් | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතිකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතිකයන් |
| 1955 .. .. .. | 106·9 | 106·4 | 110·4 | 109·9 | 108·7 | 108·2 | 110·2 | 109·7 |
| 1956 .. .. .. | 108·7 | 108·5 | 113·0 | 112·8 | 111·0 | 110·8 | 113·2 | 113·0 |
| 1957 .. .. .. | 111·2 | 108·2 | 116·0 | 112·8 | 113·8 | 110·7 | 113·9 | 110·8 |
| 1958 .. .. .. | 122·3 | 116·5 | 130·4 | 124·2 | 126·7 | 120·7 | 117·4 | 111·8 |
| 1959 .. .. .. | 122·3 | 116·3 | 130·4 | 124·0 | 126·7 | 120·4 | 117·4 | 111·6 |
| 1960 .. .. .. | 122·3 | 118·2 | 130·4 | 126·0 | 126·7 | 122·4 | 117·4 | 113·4 |
| 1961 .. .. .. | 122·3 | 116·7 | 130·4 | 124·4 | 126·7 | 120·9 | 117·4 | 112·0 |
| 1962 .. .. .. | 122·3 | 115·0 | 130·4 | 122·6 | 126·7 | 119·2 | 117·4 | 110·4 |
| 1963 .. .. .. | 122·3 | 112·4 | 130·4 | 119·9 | 126·7 | 116·5 | 117·4 | 107·9 |
| 1964 .. .. ., | 122·3 | 109·0 | 130·4 | 116·2 | 126·7 | 112·9 | 117·4 | 104·6 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) ලිපිකරු හා කාර්මික සේවකයන්ගේ හා සුළු සේවකයන්ගේ ඒකාබද්ධ දර්ශකය.

අයවැය කථාවෙන් කැරුන ප්‍රකාශයක් අනුව, රුපියලක මාසික වැටුප් වැඩිවීමක් ලබන අර්ධ පුහුණු හා නුපුහුණු රජයේ සේවකයන්ගේ මාසික වැටුප් වැඩි කිරීම 1964 ඔක්තෝබර් 1 වැනිදා සිට රුපියල් 2.50 දක්වා වැඩිකරන ලදී. මෙම වැඩි කිරීම හේතුකොටගෙන ජීවන වියදම් හා ගෙවල්කුලී දීමනා ද මසකට රුපියල් 1.50 කින් වැඩි වෙතැයි ඇස්තමේන්තු කර ඇත. දෙවැනි සේවා වර්ගීයේදී මෙම සේවක ගණයෙහි මුළු මාසික වැටුපෙහි වැඩිවීම, රුපියල් 4 ක් වෙයි. අවුරුදු දෙකක හෝ ඊට වැඩි සේවාවක් ඇති අයගේ වැටුප් අනුක්‍රමයෙන් ඊට වැඩි

වන්නේය. මෙම ප්‍රතිලාභය රජයේ සේවකයන් 90,000 ට පමණ හිමිවන බවටද 1964 – 65 වර්ෂය තුළ ඒ සඳහා රජයට රුපියල් කෝටි 0.3 ක වියදමක් දරන්නට සිදුවන බවද ඇස්තමේන්තු කොට ඇත. මෙම වැටුප් වැඩිවීම ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වෙන දර්ශකයෙන් පිළිබිඹු නොවේ. ඊට හේතුව දර්ශකය මූලික වේතනය හා වැටුප් පරිමාවන් පමණක් ගෙන සකසා තිබීමත් වැටුප් වැඩිවීමෙන් ඇතිවන වෙනස්වීම් හෝ උපරිම වේතනයෙහි හෝ වැටුප් පරිමාවන්හි හෝ ඇතිවන වෙනස්වීම් ඇතුළත් වනසේ සකසා නොතිබීමත්ය.

පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණයන්හි ඇතිවූ වෙනස්වීම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු ඇත්තේ පඩි පාලක සභා යටතට ගෙන ඇති කර්මාන්තවල නියුතු කම්කරු වැටුප් සම්බන්ධයෙන් පමණෙකි. පඩි පාලක සභා යටතට ගෙන ඇති කම්කරුවන්ගෙන් සියයට 89·4 ක්ම කෘෂිකර්මයෙහි නියුතු වූවෝ වෙති.

පඩි පාලක සභා යටතට ගෙන ඇති වෘත්තීන්හි නියුතු කම්කරුවන්ගේ වැටුප් හා මූර්ත වැටුප් අනුපාතිකයන් 1955 වර්ෂයේ සිට වෙනස්වූ අන්දම පහත සංඛ්‍ය සටහනේ දක්වේ.

සංඛ්‍යා සටහන II (ඇ) 4

**පඩිපාලක සභා යටතට ගැනෙන කර්මාන්තයන්හි නියුතු කම්කරුවන්ගේ අවම වැටුප් අනුපාතික දර්ශක අංක**

**(1952=100)**

| කාලච්ඡේදය | කෘෂිකාර්මික කම්කරුවෝ | | කර්මාන්තවල නියුතු කම්කරුවෝ | | සියළු පඩි පාලක සභා කර්මාන්තයන්හි නියුතු කම්කරුවෝ (අ) | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය |
| 1955 .. .. | 106·6 | 106·1 | 101·4 | 101·0 | 105·9 | 105·4 |
| 1956 .. .. | 107·1 | 106·9 | 102·9 | 102·7 | 106·4 | 106·2 |
| 1957 .. .. | 108·7 | 105·6 | 104·5 | 101·5 | 107·8 | 104·7 |
| 1958 .. .. | 110·2 | 105·2 | 116·1 | 110·9 | 110·8 | 105·6 |
| 1959 .. .. | 110·2 | 104·8 | 128·8 | 122·4 | 112·3 | 106·7 |
| 1960 .. .. | 110·2 | 106·5 | 128·1 | 123·8 | 111·8 | 108·0 |
| 1961 .. .. | 110·7 | 105·6 | 128·4 | 122·5 | 112·3 | 107·2 |
| 1962 .. .. | 111·9 | 105·2 | 129·5 | 121·8 | 113·7 | 106·9 |
| 1963 .. .. | 113·3 | 104·2 | 130·9 | 120·3 | 115·2 | 105·9 |
| 1964 .. .. | 116·0 | 103·5 | 132·8 | 118·4 | 117·8 | 105·0 |

සංඛ්‍යා: සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) කෘෂිකාර්මික කම්කරුවන් හා කර්මාන්තවල හා වානිජ කටයුතුවල නියුතු කම්කරුවන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

1963 දී වැටුප් හා සසඳන විට, 1964 දී කෘෂිකර්මාන්තයන්හි නියුතු කම්කරුවන්ගේ වැටුප් අනුපාතිකයන් සියයට 2.4 කින්ද, කර්මාන්තවල හා වානිජ කටයුතුවල නියුතු කම්කරුවන්ගේ වැටුප් අනුපාතිකයන් සියයට 1·5 කින්ද, වැඩිවී ඇත. ඔවුන්ගේ වැටුප් වැඩිවීමට එකම හේතුව වූයේ ජීවන වියදම් දර්ශකය වැඩිවීම නිසා දීමනා වැඩිවීමය. දීමනා වැඩි වුවද ඒවා ජීවන වියදමෙහි වැඩිවීම සහමුලින් මකාලූවේ නොවේ.